


# ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ පුරප්පාඩු

ශ්‍රී ලංකාවේ පවතින එකම අපනයන ණය රක්ෂණ ආයතනය වන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC), මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට, බැංකුවලට සහ මූල්‍ය ආයතන වලට ණය කළමනාකරණ විසඳුම් මගින් තොරතුරු, සහාය සහ ආරක්ෂාව සැපයීමේ ව්‍යාපාරයේ අපි නියැලී සිටින්නෙමු.

අඛණ්ඩව වර්ධනය වෙමින් ඉදිරියට යන අප, ශක්තිමත් අන්තර් පුද්ගල කුසලතා වලින් හෙබි සුදුසු අයදුම්කරුවන්ට අපගේ ගෞරවණීය ආයතනය හා එක් වීමට ආරාධනා කරමු.

## 01. සාමාන්‍යාධිකාරී තනතුර - HM 2-2 – පුරප්පාඩු 01

**රැකියා විෂය පථය :** සංස්ථාවේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා (COO) ලෙස, සාමාන්‍යාධිකාරීවරයා අධ්‍යක්ෂ මණ්ඩලයේ උපාය මාර්ගික උපදෙස් ක්‍රියාත්මක කිරීමේදී, ආයතනික ඉලක්ක ඉටුකර ගැනීම සඳහා කණ්ඩායම මෙහෙයවයි.

**අධ්‍යාපන සුදුසුකම් (පහත 1 හෝ 2)**

1. ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය හෝ ගණිතය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ්‍යය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් අදාළ ක්ෂේත්‍රයක උපාධියක්.

   **සමඟ**

   ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය හෝ ගණිතය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ්‍යය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් හෝ කළමනාකරණ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය.

   **සහ**

   පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 05 ක් සහිත "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් අවුරුදු 18 ක සනාථ කළ සේවා වාර්තා සහිත පළපුරුද්ද.

2. ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය හෝ ගණිතය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ්‍යය පිළිබඳ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් අදාළ ක්ෂේත්‍රයක උපාධියක්

   **සහ**

   ඕනෑම අදාළ ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක්.

   **සහ**

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සනාථ කළ සේවා වාර්තා සමග අවම වශයෙන් අවුරුදු 05 ක පළපුරුද්දක්.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** HM 2-2 - 2025 රු. [163,620 - 12X4,850-221,820] + වෘත්තිය දීමනාව, සන්නිවේදන දීමනාව, ඉතිරි නිවාඩු සඳහා වාර්ෂිකව ගෙවීම, වෛද්‍ය ප්‍රතිලාභ ආදිය ඇතුළුව රජයේ අනුමත අනෙකුත් දීමනා (සංස්ථාව විසින් නඩත්තු කරන වාහනය සහ රියදුරු ඇතුළුව)

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව ආරම්භයේ දී රු. 142,410 වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ.

## 02. සහකාර සාමාන්‍යාධිකාරී-මෙහෙයුම් (අපනයන ණය රක්ෂණ) තනතුර HM 1-1 – පුරප්පාඩු 01

**රැකියා විෂය පථය :-**

- සියලුම ණය රක්ෂණ ඔප්පු හා බැංකු ඇපකර නිකුතුව සම්බන්ධ වූ මෙහෙයුම්වල සමස්ත අධීක්ෂණය.
- ණය රක්ෂණ ඔප්පු, බැංකු ඇපකර හා විදේශීය ගැනුම්කරුවන් සඳහා වූ වගකීම් හා ණය සීමාවන් පැනවීම
- අධ්‍යක්ෂ මණ්ඩලය, සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂක, සාමාන්‍යාධිකාරී හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) වෙත විදේශීය ගැනුම්කරුවන් සඳහා වූ ණය සීමාවන් සහ ණය රක්ෂණ ඔප්පු හා බැංකු ඇපකර සඳහා වූ වගකීම් සීමාවන් පිළිබඳ වාර්තා කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලයට හා ඉහළ කළමනාකාරීත්වය සඳහා අවශ්‍ය වාර්තා නිසි කලට නිවැරදිතාවයෙන් යුතුව ලබා දීම
- අනෙකුත් අංශ සමග ඒකාබද්ධව වැඩකර මෙහෙයුම් අංශයේ වැඩ කටයුතුවල ඵලදායීත්වය හා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම
- ණය රක්ෂණ ඔප්පු සහ බැංකු ඇපකර සඳහා වූ අභ්‍යන්තර ක්‍රියාවලීන් වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.
- මෙහෙයුම් අංශයේ අභ්‍යන්තර ගැටළු සාමාන්‍යාධිකාරී හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) සමග විසඳ ගැනීම
- ණය රක්ෂණ ඔප්පු හා බැංකු ඇපකර සඳහා වූ ක්‍රියාකාරී සැලසුම ක්‍රියාවට නැංවීම
- සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂක, සාමාන්‍යාධිකාරී හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) විසින් දෙනු ලබන නියෝග ක්‍රියාත්මක කිරීම

**අධ්‍යාපන සුදුසුකම් (පහත 1 හෝ 2)**

1. ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය හෝ ගණිතය, ව්‍යාපාර පරිපාලනය, ගණකාධිකරණය, වාණිජ්‍යය, නීතිය, පිළිබඳ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් අදාළ ක්ෂේත්‍රයේ ලබාගත් ප්‍රථම උපාධියක්

   **සමඟ**

   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ තනතුරෙහි විෂය පරාසයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක සාමාජිකත්වය

   **සහ**

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වසර 13ක පළපුරුද්ද

2. තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය

   **සහ**

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වසර 13ක පළපුරුද්ද.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** HM 1-1 - 2025 රු. [140,640 - 15 X 4,100 -202,140] +වෘත්තිය දීමනා, සන්නිවේදන දීමනා, ඉතිරි නිවාඩු සඳහා වාර්ෂිකව ගෙවීම, ප්‍රවාහන දීමනාව, වෛද්‍ය ප්‍රතිලාභ ආදිය ඇතුළුව රජයේ අනුමත අනෙකුත් දීමනා

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව ආරම්භයේ දී රු. 123,019 වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ.

## 03. රියදුරු තනතුර PL 3 – පුරප්පාඩු 02

අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයන් 06කින් සමත්වීම

**සහ**

මෝටර් රථ වාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා රියදුරු බලපත්‍රය ලබා තිබීම සහ බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම පිළිබඳ අවම වශයෙන් වසර තුනක ( 03) පළපුරුද්ද ලබා තිබීම.

**වයස :** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** PL 3 - 2025 රු. [43,280 - 10 X 490- 10 × 540 - 10 X 590 -12 × 630 - 67,040] + ඉතිරි නිවාඩු සඳහා වාර්ෂිකව ගෙවීම, වෛද්‍ය ප්‍රතිලාභ ඇතුළුව රජයේ අනුමත අනෙකුත් දීමනා

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව ආරම්භයේ දී රු. 40,834 වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ.

**සාමාන්‍ය කොන්දේසි**

*සෑම අයදුම්කරුවෙකුම,*

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය.

ඉහත තනතුරු සඳහා අයදුම්පත්, අදාළ සහතිකවල ඡායා පිටපත් සහ නෑදෑයින් නොවන නිර්දේශකයින් (non related refrees) දෙදෙනෙකුගේ තොරතුරු සමග, 2026 ජනවාරි 19 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **"සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, 4 වන මහල, NDB - EDB කුළුන, අංක 42, නවම් මාවත, කොළඹ 02"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

SLECIC
Information, Support & Protection

Chairman & Managing Director
Sri Lanka Export Credit Insurance Corporation
Level 4, NDB - EDB Tower,
No 42,Nawam Mawatha,
Colombo 02.

Telephone : 011 2307519
Fax : 011 2307515
Web : www.slecic.lk